# 2024-08-12 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. **ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල අතර අධ්‍යාපනික සහයෝගීතාව අරමුණු කර ගනිමින් අවබෝධතා/සහයෝගීතා ගිවිසුම්වලට එළඹීම**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම් දර්ශකවල ඉහළට ඔසවා තැබීමේ සහ උසස් අධ්‍යාපනික සහයෝගීතාවන් වර්ධනය කිරීමේ අරමුණින්, මෙරට විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල අතර අවබෝධතා/සහයෝගීතා ගිවිසුම් අත්සන් කිරීමට යෝජිතව ඇත. එම අවබෝධතා/සහයෝගීතා ගිවිසුම් විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ හා නිර්දේශවලට අනුකූලව සකස් කරනු ලැබ තිබේ. ඒ අනුව, අධ්‍යාපන සහ පර්යේෂණ ක්ෂේත්‍රයන්හි අන්‍යෝන්‍ය සහභාගිත්වයන් සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉලිනොයි විශ්වවිද්‍යාලයේ භාරකාර මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම වෙනුවෙන් ආවරණ අනුමැතිය සඳහාත්, පහත සඳහන් අවබෝධතා/සහයෝගීතා ගිවිසුම්වලට අත්සන් තැබීම සඳහාත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* ධාරිතා සංවර්ධනය, පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ පර්යේෂණ සිදු කිරීමේ අරමුණින්, යාපනය විශ්වවිද්‍යාලය සහ එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය අතර සහයෝගීතා ගිවිසුම.

* වෛද්‍ය ක්ෂේත්‍රයේ ඒකාබද්ධ පර්යේෂණ පැවැත්වීම, දෙරට අතර සිසුන්ගේ අධ්‍යාපනික හුවමාරුව හා/හෝ ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපනික වැඩසටහන් සංවර්ධනය කිරීමේ අරමුණින්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* ඖෂධවේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාව ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින්, ශිෂ්‍ය-අධ්‍යයන කාර්යමණ්ඩල හුවමාරු කර ගැනීමට අදාළව

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ මහජන චීන සමූහාණ්ඩුවේ හූනාන් චීන වෛද්‍ය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* ගෝලීය මට්ටමින් විද්‍යාත්මක දැනුම හා සංස්කෘතික සම්ප්‍රදායන් හුවමාරු කර ගැනීමේ අරමුණින් අන්‍යෝන්‍ය එකඟතාව මත ඒකාබද්ධ ක්‍රියාකාරකම්වලට එළඹීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මේරිලන්ඩ් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

  අධ්‍යාපන හා පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා අධ්‍යයන කාර්යමණ්ඩල හුවමාරු කර ගැනීමේ අරමුණින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ ජපානයේ මෙයිජි විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* සමුද්‍රීය රාජ්‍යයන්හි සහයෝගීතා වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ එක්සත් රාජධානියේ පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය අතර අවබෝධතා ගිවිසුම.

* ශාස්ත්‍රීය සහයෝගීතාව වර්ධනය කර ගැනීමත් දෙපාර්ශ්වය අතර ඓතිහාසික, සංස්කෘතික හා බුද්ධිමය සබඳතා ශක්තිමත් කිරීමත් අරමුණු කර ගනිමින්, කැලණිය විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ නාලන්දා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* අධ්‍යයන පර්යේෂණ ක්ෂේත්‍රයේ සහයෝගීතාව වර්ධනය කර ගැනීමේ අරමුණින්, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ වියට්නාම බෞද්ධ ඇකඩමිය අතර අවබෝධතා ගිවිසුම.

02. **දේශීය ඉඟුරු නිෂ්පාදනය සහ මිල නියාමනය**

ඉඟුරු නිෂ්පාදනය සඳහා පහසුකම් සලසමින්, දේශීය වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයාට දැරිය හැකි මට්ටමකට ඉඟුරුවල සිල්ලර මිල අඩු කිරීමේ හැකියාව එක්ව සොයා බලා, ඒ සම්බන්ධයෙන් යෝග්‍ය නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ට සහ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා

අමාත්‍යාංශයේ ලේකම්ට 2024-07-15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, ඉදිරිපත් කරන ලද වාර්තාවේ නිර්දේශ මත පදනම්ව, ඉදිරි මාස 03ක කාලසීමාව තුළ අමු ඉඟුරු මෙට්‍රික්ටොන් 3,000ක් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් අදියරගතව ආනයනය කිරීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා; සහ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **හොරණ, මිල්ලෑවවත්ත නගර සංවර්ධන ව්‍යාපෘති භූමිය තුළ අවිධිමත්ව පිහිටි වතු සේවක නිවාස සඳහා පුනස්ථාපන පදනමින් නව නිවාස ඒකක ලබා දීම**

ඖෂධ නිෂ්පාදන ගම්මානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය, වැලිකඩ බන්ධනාගාර පුනස්ථාපන ව්‍යාපෘතිය, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ව්‍යාපෘතිය සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ විශ්වවිද්‍යාල ගම්මානයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය යන සංවර්ධන ව්‍යාපෘති සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් හොරණ මිල්ලෑවවත්ත ඉඩමෙන් බිම් කොටස් ලබා දීමට කටයුතු කරමින් පවතී. එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත භූමිය තුළ පිහිටි අවිධිමත් පැරණි වතු නිවාස ඒකක කඩිනමින් ඉවත් කළ යුතුව ඇත. ඒ අනුව, මිල්ලෑවවත්ත ඉඩමේ යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා බාධාවක්ව පවතින අවිධිමත් නිවාස ඒකක 54 ඉවත් කර, එකී නිවාසවල පදිංචි පවුල් වෙත අදියර 02ක් යටතේ පර්චස් 10ක ඉඩම් කොටසක් සහිත නිවසක් බැගින් සින්නක්කර පදනමින් මුදල් අය කිරීමකින් තොරව ලබා දීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ශ්‍රී ලංකා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2024-2029 ක්‍රියාත්මක කිරීම**

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය කළමනාකරණය කිරීම සඳහා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු අතර, එම සැලැස්ම වසර පහකට (05) වරක් යාවත්කාලීන කළ යුතුය. ඒ අනුව, 2018 වර්ෂයේදී පිළියෙල කර ක්‍රියාත්මක කරනු ලැබූ සැලැස්ම සංශෝධනය කරමින් "ශ්‍රී ලංකා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම 2024-2029" පිළියෙල කරනු ලැබ ඇත.

එකී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පුත්තලම අරුවක්කාලු මයෝසීන හුණුගල් නිධිය ආශ්‍රිත ප්‍රදේශය සුරක්ෂිත කිරීම**

වසර මිලියන 26-195 අතර ඉතා ඈත යුගයකට අයත් පුරාවිද්‍යාත්මක සාධක අන්තර්ගත වූ අවසාධිත පාෂාණ තැන්පතුවක් පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අරුවක්කාලු ප්‍රදේශයේ පිහිටා ඇති බව භූ විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක පර්යේෂණ මඟින් තහවුරු වී ඇත. එම භූමියෙහි පිහිටා ඇති හුණුගල් නිධිය තුළින් මයෝසීන යුගයට අයත් වඳ වී ගිය සහ දැනට ජීවත් වන සත්ත්ව වර්ග 40කට වඩා වැඩි ප්‍රමාණයක පොසිල සාධක හමුවී තිබේ. ඒ අනුව, එම ප්‍රදේශය සුරක්ෂිත කිරීම පිණිස 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ සහ 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතේ විධිවිධාන පරිදි හෙක්ටයාර 10ක ප්‍රදේශයක් පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස නම් කිරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **ශ්‍රී ලංකාවේ පානීය ජල අංශයේ ආයෝජනයන් සඳහා තෝරා ගැනීමේ නිර්ණායක රාමුව**

ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, පාර්ශ්වකාර නියෝජිතායතන සහ ශාස්ත්‍රඥයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක අධීක්ෂණය යටතේ ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ පානීය ජල අංශයේ ආයෝජන සඳහා තේරීම් නිර්ණායක රාමුව සකස් කරනු ලැබ ඇත. එකී නිර්ණායක රාමුව ක්‍රියාත්මක කිරීම පිණිස ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **නිරිත දිග මෝසම සක්‍රීය වීම හේතුවෙන් ඇති වූ ගංවතුර, අධික සුළං ඇතුළු ආපදාවන්ගෙන් හානි වූ නිවාස ඉදි කිරීම සහ අලුත්වැඩියා කිරීම**

2024-05-15 දින සිට දිවයිනේ නිරිත දිග මෝසම සක්‍රීය වීම හේතුවෙන් ඇති වූ ගංවතුර, අධික සුළං ඇතුළු ආපදා තත්ත්වයන්ගෙන් පවුල් 120,215ක පුද්ගලයින් 454,625ක් ආපදාවට ලක්වී ඇති අතර, පූර්ණ නිවාස හානි 172ක් හා අර්ධ නිවාස හානි 20,075ක් වාර්තා වී ඇත. ඒ

අනුව, නිවාස පූර්ණ ලෙස හානි වූ පවුල් 172 සඳහා එම ස්ථානයේම හෝ වෙනත් සුරක්ෂිත ස්ථානයක නිවාස ඉදිකර දීමටත්, අර්ධ වශයෙන් හානි වී ඇති නිවාස 20,075 සඳහා වන්දි ලබා දීමටත් ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය ස්ථාන හා ගොඩනැඟිලිවල වහලයේ සූර්ය පැනල සවිකර පවත්වාගෙන යාම**

දුම්රිය දෙපාර්තමේන්තුව සතුව දුම්රිය ස්ථාන 300කට අධික සංඛ්‍යාවක් පවතින අතර, ඒවායේ වහල මත සූර්ය බලය මගින් විදුලිය උත්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම වඩාත් සුදුසු බව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් වශයෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 03 කොටසේ 1R සහ 1S කොන්ත්‍රාත් පැකේජ සඳහා වන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම**

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 03 වන කොටසේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පැකේජ 19කට බෙදා ඇති අතර, ඉන් 1A සිට 1Q දක්වා වන පැකේජ 17ක් දැනටමත් ප්‍රදානය කරනු ලැබ ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත 1R සහ 1S කොන්ත්‍රාත් පැකේජ සඳහා සුදුසුකම් ලත් දේශීය ඉදිකිරීම් ආයතන වෙතින් තරඟකාරී පදනම මත ලංසු කැඳවා තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත 1R සහ 1S කොන්ත්‍රාත් පැකේජ ප්‍රදානය කිරීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම අපරානුමත කිරීම**

ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම ශ්‍රී ලංකාවේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා සහ තායිලන්තයේ වාණිජ අමාත්‍යවරයා විසින් 2024-02-03 දින අත්සන් තබා ඇති අතර, එකී

ගිවිසුම 2024-07-12 දින පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබ ඇත. එම ගිවිසුමේ 14.10 වගන්තිය අනුව, අභ්‍යන්තර නීතිමය අවශ්‍යතා සහ ක්‍රියාපටිපාටිය සම්පූර්ණ කර ඇති බව සඳහන් කරමින් එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත සිදු කරන අවසාන දැනුම් දීමෙන් පසු දෙවන පාර්ශ්වයේ දැනුම් දීමෙන් තිස් වන දින සිට ගිවිසුම බලාත්මක වේ. එම කරුණු මත පදනම්ව, ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම අපරානුමත කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කළ 2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම (සැකසුම් සහ ප්‍රති-අපනයනය සඳහා අනුමත ව්‍යවසායන් විසින් කුළුබඩු ආනයනය කිරීම)**

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ සාදන ලද, අංක 2393/36 දරන 2024-07-18 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති, 2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ 2024 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති**

දැනට බලපවත්නා අපනයන ඉපැයීම් සම්බන්ධයෙන් වන රීති, එනම් "2022 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති (සංශෝධිත)" ලිහිල් කරන ලෙස අපනයනකරුවන්, අපනයනකරුවන්ගේ නියෝජිතයන් සහ ඇතැම් රජයේ නියෝජිතායතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කරුණු ඉදිරිපත් කර ඇත. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක වීමත් සමඟ පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා නව රීති නිකුත් කළ යුතුව ඇත. ඒ අනුව, අංක 2391/02 දරන 2024-07-01 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති, 2023 අංක 16 දරන ශ්‍රී

ලංකා මහ බැංකු පනතේ විධිවිධාන පරිදි සකස් කරන ලද 2024 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **කොළඹ වරාය නගරය තුළ ජාත්‍යන්තරව පිළිගත් පාසල, විශ්වවිද්‍යාලය සහ රෝහල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිවලට ඉඩම් බදු දීම සඳහා වන යෝජිත රාමුව**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 6(1)(ඇ) වගන්තිය මඟින් කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ පිහිටි සහ කොමිෂන් සභාවට පවරා ඇති රජයේ අලෙවි කළ හැකි ඉඩම් බදු දීමට කොමිෂන් සභාව වෙත බලය ලබා දී ඇත. ඒ අනුව, කොළඹ වරාය නගරයේ පාසල, විශ්වවිද්‍යාලය සහ රෝහල යන ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා ආයෝජකයින් තෝරා ගැනීම පිණිස කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් යෝජනා කැඳවා ඇත. ආසන්න වශයෙන් රෝහල සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 100ක් ද, පාසල සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 25ක් ද සහ විශ්වවිද්‍යාලය සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 25ක් ද ආයෝජනය කිරීම සඳහා වන යෝජනාවක් ආසිරි වරාය නගරය රෝහල (පෞද්ගලික) සමාගම සහ හේට්වේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල (පෞද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ 6(1)(ඇ) වගන්තියෙහි විධිවිධාන පරිදි රෝහල, පාසල සහ විශ්වවිද්‍යාලය සඳහා ඉඩම් කොටස් බදු දීම සඳහා වන ගිවිසුම්වලට එළඹීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **පින්නවල - කිතුල්ගල සංචාරක කලාපය සංවර්ධනය**

2024 අයවැය යෝජනාවක් මඟින් පින්නවල - කිතුල්ගල සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 750ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ යටතේ හඳුනාගනු ලැබ ඇති යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව, පින්නවල - කිතුල්ගල සංචාරක තීරය සංවර්ධනය කිරීමේ වැඩසටහනට අදාළව හඳුනාගෙන ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීම**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම පිණිස 2022-05-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ද ලැබී තිබේ. එකී (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **අපරාධයකින් උපයාගත් දේපළ පිළිබඳ පනත් කෙටුම්පත**

අපරාධයකින් උපයාගත් දේපළ පිළිබඳ යෝජිත නීතියෙහි ප්‍රතිපත්ති හා නීතිමය රාමුව සහ නීති ප්‍රතිපාදන කෙටුම්පත් සංවර්ධනය කිරීම සඳහා වූ කමිටුවේ වාර්තාවට අනුකූලව, අපරාධයකින් උපයාගත් දේපළ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා 2024-04-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **කළම්බු මරීනා ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම**

"නිකේතන වරාය" (MARINA) සංවර්ධන ව්‍යාපෘතිය සඳහා බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට් පෞද්ගලික සමාගමේ පූර්ණ හිමිකාරිත්වය සහිත සමාගම වන කළම්බු මරීනා ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කැබැලි 04ක් බදු පදනම මත ලබා දී ඇත. යාත්‍රා 243ක් නවතා තැබිය හැකි සහ සම්පූර්ණ ධාරිතාවකින් යුත් කැපිටනරි, අමුත්තන් සඳහා සමාජ ශාලා, ආහාර පාන, සිල්ලර වෙළෙඳ සැල්, විනෝදාස්වාද ස්ථාන, උත්සව සඳහා ඉඩපහසුකම් සහ වාහන නැවැත්වීමේ ඉඩකඩ ද එම ව්‍යාපෘතිය මඟින් නිර්මාණය කර ඇත. ඒ අනුව, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන පරිදි කළම්බු මරීනා ඩිවලොප්මන්ට්

(ප්‍රයිවට්) ලිමිටඩ් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් වශයෙන් නම් කිරීමටත්, එකී ව්‍යාපාරය සඳහා අදාළ නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමටත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 18. ජල ගාස්තු සංශෝධනය

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දැනට පවතින ජල ගාස්තු 2023-08-01 දින සිට ක්‍රියාත්මක කරනු ලබන අතර, එම ගාස්තු සමාලෝචනය කිරීම සඳහා ගාස්තු ප්‍රතිපත්තිය සහ සූත්‍රය ක්‍රියාත්මක කිරීම පිණිස 2024-07-15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. 2024-07-16 දින සිට ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි ගාස්තු අඩු කරනු ලැබ ඇති බැවින් සහ ඉන්ධන, රසායනික ද්‍රව්‍ය හා පොලී පිරිවැය යනාදියෙහි පිරිවැය අඩු වීම සැලකිල්ලට ගනිමින් ජල ගාස්තු යම් ප්‍රතිශතයකින් අඩු කිරීමේ හැකියාව පවතී. ඒ අනුව, පහත සඳහන් පරිදි ජල ගාස්තු සංශෝධනය කිරීම පිණිස ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

| අංකය | ගාස්තු කණ්ඩායම | යෝජිත අඩු කිරීමේ සාමාන්‍ය (%) |
|---|---|---|
| 01. | සමෘද්ධිලාභීන් සහ නාගරික වතු ජනාවාස හැරුණු කොට ගෘහස්ථ කාණ්ඩය | 7 |
| 02. | රජයේ රෝහල් | 4.5 |
| 03. | පාසල් සහ පූජ්‍ය ආයතන | 6.3 |
| | **සමස්ත අඩු කිරීමේ සාමාන්‍ය** | **5.94** |

## 19. රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධනය කිරීම සඳහා වූ යෝජනා

රාජ්‍ය සේවයේ වැටුප්, වේතන හා අනෙකුත් පාරිශ්‍රමිකයන් සමාලෝචනය කර, රාජ්‍ය සේවයේ සියලුම අංශයන්හි වැටුප් සංශෝධනය කිරීම සඳහා වූ යෝජනා, 2025 අයවැය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා වන නිර්දේශ ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස විශේෂඥ කමිටුවක් පත් කිරීම සඳහා 2024-05-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා

දී ඇත. ඒ අනුව හිටපු ජනාධිපති ලේකම් උදය සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද විශේෂඥ කමිටුව විසින් රාජ්‍ය නිලධාරීන් සහ රාජ්‍ය අංශයේ ප්‍රධාන වෘත්තීය සංගම් සමඟ සාකච්ඡා කරනු ලැබ ඇති අතර, අදාළ තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව අතුරු වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබ තිබේ. එකී වාර්තාවේ නිර්දේශිත පහත සඳහන් යෝජනා සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීමටත්, අදාළ යෝජනා 2025 වර්ෂයේ අයවැයට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* සමස්ත රාජ්‍ය සේවයේ සියලුම තනතුරු ප්‍රධාන මට්ටම් 04ක් යටතේ වර්ගීකරණය කර, එක් එක් කාණ්ඩය ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) හා ජාතික වෘත්තීය නිපුණතාව (NVQ) පදනම් කර ගනිමින් හා අදාළ රැකියා කාර්යභාරය, වගකීම් හා විශේෂ රැකියා සඳහා නිපුණතාවකින් යුත් සේවකයින් ආකර්ෂණය කර ගැනීම හා රැකියාවන්හි රඳවා ගැනීම සැලකිල්ලට ගෙන, බඳවාගැනීමේ සුදුසුකම් අනුකාණ්ඩවලට වර්ගීකරණය කිරීම.

  ප්‍රාථමික සේවා කාණ්ඩ සඳහා ද බඳවාගැනීමේ මූලික සුදුසුකම් ලෙස ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය, ජාතික වෘත්තීය නිපුණතාව පදනම්ව සේවා අවශ්‍යතාව පරිදි සුදුසු තෝරා ගැනීමේ ක්‍රමවේද අනුගමනය කිරීම.

* අනෙකුත් සියලුම සේවා කාණ්ඩ සඳහා විධිමත් තරඟ විභාග හා සම්මුඛ පරීක්ෂණ ක්‍රම මඟින් පමණක් බඳවාගැනීම.

* ඒ අනුව යෝග්‍ය පරිදි දැනට පවතින අනුමත බඳවාගැනීමේ පටිපාටි කඩිනමින් සංශෝධනය කිරීම.

* 2025 පාදක වසර ලෙස සලකා ජීවන වියදම් දීමනා සඳහා සිදු කර ඇති විවිධ ගැලපීම් හා මේ වන විටත් එක් කොට ඇති දීමනා සියල්ල ඒකාබද්ධ කොට, සියලුම රජයේ සේවකයින් සඳහා (සෑම වසර 03කටම වරක් සංශෝධනය කිරීමට යටත්ව) ජීවන වියදම් දීමනාව ලෙස මාසිකව රුපියල් 25,000/-ක් ගෙවීම.

* රාජ්‍ය සේවයේ අවම ආරම්භක මාසික වැටුප 24%ක අවම ප්‍රතිශතයකින් වැඩි කොට, ජීවන වියදම් දීමනාව සමඟ දළ වැටුප රුපියල් 55,000/-ක් ලෙස ගෙන, අනෙකුත් සියලුම තනතුරු සඳහා මූලික වැටුප ඒ අනුව ගැලපීම.

* ව්‍යාපාරික රාජ්‍ය සමාගම් හා බැංකු හැර අන් සියලුම රාජ්‍ය ආයතන සඳහා මෙම නව වැටුප් හා දීමනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

  2030 වන විට රාජ්‍ය සේවයේ සමස්ත සේවක මණ්ඩලය ලක්ෂ දහයක් (1,000,000) හෝ ඊට අඩු මට්ටමක් දක්වා සීමා කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම.

* ඒ අනුව 2025 සිට වසර 03ක් ඇතුළත සමස්ත රාජ්‍ය සේවයේ හැකි සෑම ක්ෂේත්‍රයක් තුළම ඩිජිටල්කරණය (Digitalization) හා ස්වයංක්‍රියකරණය (Automation) තුළින් ඉලෙක්ට්‍රොනික පද්ධති මඟින් රාජ්‍ය පාලනය සඳහා ක්‍රමවේදයක් (E-Governance) හඳුන්වා දීම සහ ඒ සඳහා රාජ්‍ය ආයෝජනයේ ප්‍රමුඛතාව ලබා දීම.

* රාජ්‍ය අංශයේ සියලුම සේවකයින් හා විශ්‍රාමිකයින් ද ඇතුළත්ව මාසිකව අවම රුපියල් 1,000/-ක දායකත්වයක් සහිත වඩාත් ආකර්ෂණීය ප්‍රතිලාභ හිමි වන පරිදි වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් 2025 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීම.

* හැකි සෑම අවස්ථාවකම බාහිර සේවා (Outsourcing) වැනි ක්‍රමවේද මඟින් රජයේ වැය බර අවම වන ලෙස කාර්යක්ෂමතාව උපරිම වන පරිදි නියමිත ක්‍රමවේද අනුගමනය කරමින් සේවා ලබා ගැනීම.

* හඳුනාගත් රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත ආයතන කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සීමිත පොදු සමාගම් (Public Liability Company) බවට පත් කිරීමේ ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

  නිසි වැඩ අධ්‍යයනයක් සිදු කොට, සමස්ත රාජ්‍ය අංශයේ කාර්යමණ්ඩලවල හා සේවා පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම පිණිස 2025 වසර තුළ කටයුතු කිරීම.

* ඒ අනුව සියලුම රාජ්‍ය සේවකයින් සඳහා කාර්යසාධක දර්ශක සකස් කොට, එහි ප්‍රගතිය පදනම් කර ගනිමින් වැටුප් වර්ධක ලබා දීම.

* 2020 වසරට පෙර විශ්‍රාමලත් රාජ්‍ය නිලධාරින්හට හිමිකම් ලැබූ වැටුප් වර්ධක ලබා දී ඔවුන්ගේ විශ්‍රාම වැටුප සංශෝධනය කර අදාළ විෂමතා නිරවුල් කිරීම.

* විශ්‍රාමිකයින් සඳහා ජීවන වියදම් දීමනාව, සක්‍රීය සේවයේ නියුතු රාජ්‍ය නිලධාරින් සඳහා ලබා දෙන ජීවන වියදම් දීමනාවෙන් 50%කට සමාන වන පරිදි 2025 ජනවාරි මස සිට ලබා දීම.

* දැනට පවතින බදු ප්‍රතිපත්තිය තුළම මෙම වියදම් කළමනාකරණය කිරීමට යටත්ව, මෙම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ යෝජිත වැටුප් ක්‍රමය 2025-01-01 දින සිට රාජ්‍ය මූල්‍ය අවකාශ ද සැලකිල්ලට ගෙන අදියරගතව ක්‍රියාත්මක කිරීම.

**20. ලයින් කාමරවල ජීවත් වන වතු සේවක පවුල් සඳහා "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභයන්හි නිර්ණායක අදාළ කිරීම**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය දැනට 'අස්වැසුම' සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර, අදාළ ප්‍රතිලාභීන් තෝරාගැනීම 2002 අංක 24 දරන සුබසාධන ප්‍රතිලාභ පනතේ විධිවිධාන පරිදි සාදන ලද 2022 අංක 1 දරන සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ (ගෙවීම් ලැබීම් පිණිස සුදුසු තැනැත්තන් තෝරාගැනීම) නියෝගවලට අනුව සිදු කරනු ලබයි. එකී නියෝග යටතේ නියම කරනු ලැබූ සුදුසුකම් නිර්ණායක සපුරාලනු තැනැත්තන් හෝ පවුල් 'අස්වැසුම' ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා හිමිකම් ලබයි. වැවිලි ක්ෂේත්‍රයේදී, වතු තුළ තනි නිවාස නොමැති වීම හේතුවෙන් වතු සේවකයින්ගේ විස්තෘත පවුල් බොහෝ විට හවුලේ ලයින් කාමරවල පදිංචිව සිටී. වත්මන් පරිචය අනුව, එම අවකාශයන් තුළ සහජීවනයෙන් වෙන් වූ පවුල් සංඛ්‍යාව නොසලකා, ලයින් කාමරවල ජීවත් වන සියලුම තැනැත්තන් එක් පවුල් ඒකකයක් ලෙස සලකනු ලබන අතර, එම තත්ත්වය එකී පවුල්වලට අවාසිදායක වන බව පෙනී ගොස් තිබේ. එබැවින්, 2022 අංක 1 දරන සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ (ගෙවීම් ලැබීම් පිණිස සුදුසු තැනැත්තන් තෝරාගැනීම) නියෝග යටතේ, 'අස්වැසුම' යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් නිර්ණය කිරීමේදී ලයින්

කාමරවල ජීවත් වන වතු සේවක පවුල්වල සත්‍ය සංඛ්‍යාව සැලකිල්ලට ගෙන කටයුතු කරන ලෙස සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත නියම කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********